# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1885/2 - 2014 ඔක්තෝබර් මස 20 වැනි සඳුදා - 2014.10.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (xii)

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

27(1) වැනි වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 27 (1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින් එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව සඳහන් කරනු ලබන්නා වූ 2009 මැයි මස 21 වැනි දින අංක 1602/20 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත 2007 පෙබරවාරි මස 02 වැනි දින අංක 1482/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:–

(1) ඉහත කී නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ “පීඨය” යන ශීර්ෂය යටතේ දැක්වෙන “ශාස්ත්‍ර පීඨය” යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වැනි තීරයේ “අධ්‍යයන අංශ” යන ශීර්ෂය යටතේ දැක්වෙන සියලුම අයිතම ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

| “*I වැනි තීරය* | | *II වැනි තීරය* |
|---|---|---|
| *පීඨය* | | *අධ්‍යයන අංශ* |
| ශාස්ත්‍ර පීඨය | 1. | අරාබි හා ඉස්ලාමීය සංස්කෘතික අංශය |
| | 2. | පුරාවිද්‍යා අංශය |
| | 3. | සම්භාව්‍ය භාෂා අංශය |
| | 4. | ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අංශය |
| | 5. | අධ්‍යාපන විද්‍යා අංශය |
| | 6. | ඉංග්‍රීසි භාෂා අංශය |
| | 7. | ලලිත කලා අංශය |
| | 8. | භූගෝල විද්‍යා අංශය |

| *I වැනි තීරය* <br> *පීඨය* | | *II වැනි තීරය* <br> *අධ්‍යයන අංශ* |
|---|---|---|
| | 9. | ඉතිහාස අංශය |
| | 10. | දේශපාලන විද්‍යා අංශය |
| | 11. | දර්ශන හා මනෝ විද්‍යා අංශය |
| | 12. | පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය |
| | 13. | දෙමළ භාෂා අංශය |
| | 14. | සිංහල භාෂා අංශය |
| | 15. | සමාජ විද්‍යා අංශය |
| | 16. | නීති අංශය ” |

(2) ඉහත කී නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ “පීඨය” යන ශීර්ෂය යටතේ දැක්වෙන “සම සෞඛ්‍ය විද්‍යා පීඨය” යන අයිතමයට සහ ඊට අනුරූපීව එම උපලේඛනයේ II වැනි තීරයේ “අධ්‍යයන අංශ” යන ශීර්ෂය යටතේ දැක්වෙන අයිතමවලට ඉක්බිතිවම පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන් :-

| *“I වැනි තීරය* <br> *පීඨය* | | *II වැනි තීරය* <br> *අධ්‍යයන අංශ* |
|---|---|---|
| කළමනාකරණ පීඨය | 1. | කළමනාකරණ අධ්‍යයන අංශය |
| | 2. | ව්‍යාපාර මූල්‍ය අංශය |
| | 3. | මානව සම්පත් කළමනාකරණ අංශය |
| | 4. | අලෙවි කළමනාකරණ අංශය |
| | 5. | මෙහෙයුම් කළමනාකරණ අංශය |
| | 6. | ගණකාධිකරණ අංශය |
| | 7. | ව්‍යාපාර ආර්ථික විද්‍යා අංශය |
| | 8. | ව්‍යාපාර තොරතුරු තාක්ෂණ අංශය ” |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

11 – 05

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.